චක්‍රලේඛ අංක : 03/2023

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2023.04. 27

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

සමූපකාර සේවක කොමිෂන් සභා බඳවා ගැනීම් පටිපාටියේ විධායක මට්ටමේ තනතුරු හඳුන්වා දීම

දැනට ක්‍රියාත්මක සමූපකාර සේවක කොමිෂන් සභා බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව තනතුරු වලට බඳවා ගැනීමේදී, ඒ ඒ තනතුරු වල සුදුසුකම් නිශ්චය කිරීමේදී විධායක මට්ටමේ තනතුරක සේවා පළපුරුද්ද සලකන අවස්ථා වලදී, සමූපකාර සමිතියක විධායක මට්ටමේ තනතුරු හඳුනාගැනීමේ නිශ්චිත නිර්ණායකයක් නොමැති වීමෙන් සමූපකාර සමිති යම් යම් තනතුරු සඳහා බඳවා ගැනීමේදී දුෂ්කරතාවයට පත්වන බව කොමිෂන් සභාවට පෙනී ගොස් ඇත.

02. එම නිසා පහත සඳහන් වැටුප් පරිමාණයන්ට අදාල තනතුරු විධායක මටටමේ තනතුරු ලෙස සැලකිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.

i. 101 වැටුප් පරිමාණයට අදාල සියළු තනතුරු

ii. 102.4 වැටුප් පරිමාණයට අදාල සියළු තනතුරු

iii. 102.5 වැටුප් පරිමාණයට අදාල සියළු තනතුරු

03. එසේ වුවද යම් තනතුරක සේවකයකු ඉහත වැටුප් පරිමාණයක් තම තනතුරේ ශ්‍රේණි උසස් විම මත හිමිකර ගැනීම, විධායක ශ්‍රේණියේ තනතුරකට උසස් වීමක් ලෙස සලකනු නොලැබේ.

04. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන් 2023.05.01 දින සිට බලපැවැත්වේ

කොමිෂන් සභා නියමය පරිදි,

එම්.ජේ.පී.ජයකොඩි.
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. ) - කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.